# රනිල්ට ඉඩ දීල ධනපති බලයට එරෙහි දේශපාලන රැල්ලකට ඉඩ දෙනවද?

ලෝකය පුරා ගෝලීය බලවතුන්ගේ උවමනාව අනුව රාජ්‍ය පාලකයින් වෙනස් කිරීමට කටයුතු කරණ බවට අදහසක් තියෙනව. දැන් ගෝලීය බලවතුන් කියන්නේ කව්ද කියල ප්‍රශ්නයක් තියෙනව.

**කව්ද ගෝලීය බලවතුන් ?**

බුෂ්, බ්ලෙයාර්, දෙන්නට ඉතාම සමීපව කටයුතු කරපු ඕස්ට්‍රේලියානු හවර්ඩ් අගමැති තුමා දෙහි ලෙල්ලක් වගේ වීසි වෙලා ගියා. ඒ වගේම ඇමරිකානු ජනාධිපති තරගයේ දී බුෂ්ගේ ප්‍රතිපත්ති වලට විරුද්ධ අළුත් ජනාධිපති කෙනෙක් පත් වෙන බවට ලොකු බලාපොරොත්තු ඇති වෙලා තියෙනව.

මේ සියල්ල යට තිබෙන්නේ ආර්ථික බලවේග බවයි අපට කියන්න තියෙන්නේ. දේශපාලකයෝ මොන තරම් බලවතුන් ලෙස පෙනුනත් ලෝක ආර්ථික තන්ත්‍රයේ උවමනාවන් අනුව මේ අය ඉත්තන් බවට පත් වෙනව.

අද ආර්ථික තන්ත්‍රය හැටියට ක්‍රියාත්මක වෙන්නේ බහු ජාතික සමාගම් තත්ත්‍රයක්. එනිසා මේ තන්ත්‍රයේ උවමනාව අනුවයි මේ වෙනස් කම් බොහොමයක් සිදුවන්නේ. විශේෂයෙන් මේ තන්ත්‍රයේ නියාමක සංවිධාන වන ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක වෙළඳ සංවිධානය යන බල ත්‍රිකෝණය මේ තීන්දු අනියම් ලෙස ප්‍රකාශ කරන ආයතන බවට පත් වෙලා තියෙනව.

මෙයිනුත් මේ යුගයේ වඩා දැනුවත් ආයතය වෙන්නේ ලෝක වෙළඳ සංවිධානය යි. ඕස්ට්‍රේලියානු නායකයා කල ලොකුම වැරැද්ද ලෝක වෙළඳ සංවිධානයත් අවසන් ලෙසට අනුමැතිය දුන් පරිසර ගිවිසුමට අත්සන් නොකිරීම යි.

ඇමරිකාවේ බුෂ් වුනත් මෙයට අත්සන් කර නැත්තේ ඇමරිකානු බලවත් කොම්පැණි කිහිපයකට අවනත වෙලා. ඒත් ලෝක තන්ත්‍රය එය අනුමත කරල ඇති බව හිටපු උප ජනාධිපතිගේ පරිසර ව්‍යාපෘතියට ලොකු ගෞරවයක් ලබා දීමෙන් පෙනෙනව.

**අදට ගැලපෙන සටන් පාඨ**

මේ අනුව බැළුවහම ගෝලීය ධනපති බලය ක්‍රියාත්මක වෙන්නේ දේශපාලන නායකයින්ගේ ජාතික සැලසුම් අනුව ම නොමෙයි. ඊට වඩා පුළුල් ලෙස ගෝලීය ධනවාදය තම සමස්ථ පැවැත්ම ගැන ක්‍රියාකාරී වෙනවා. එනිසා පරණ අධිරාජ්‍ය විරෝධී සටන් පාඨ අදට ගැලපෙන්නේ නෑ.

ඒ වෙනුවට බහු ජාතික සමාගම් තන්ත්‍රය මනුස්සයට මොකද කරන්නේ කියල බලන්න වෙනව. ලොකු එකා ලොකු මහත් කරමින් පොඩි එකා විනාශ කරමින් යන ගමන යන්නෙත් එක්තරා පිළවෙලකට. තමන්ට මූලික හානියක් වෙනව නම් එයට විශේෂ පිළියම් යොදන්නට තරම් මේ තන්ත්‍රය අද දැනුවත්.

ඉරානයේ යුධය ඇති කලා වගේ ම එය අවසන් කරන්නටත් එයට අවශ්‍ය වෙනව. දිගට ම එය පැවතීමෙන් තම සමස්ථ ගමනට වන හානිය ගැන සිතා බැලීමටත් බුද්ධිමය හැකියාවක් එයට අයිති වෙනවා.

පශ්චාත් නූතනවාදී ධනවාදය ඉතාම සියුම් හතුරෙක්. ඔහු ගොතාගෙන යන ඒඑරසං එක කොතනින් පටන් අරන් කොතනින් ඉවර වෙනවද කියල බලාගන්නට ඉතාම හොඳින් කල්පනාවෙන් සලකා බලන්න වෙනව.

**ගෝලීය ධනවාදය ලංකාව දිහා බලන විධිය**

ලංකාවේ පාලනය වෙනස් කරන්නට ගෝලීය ධනවාදී බලයට උවමනාවක් තියෙනවද? පසුගිය දවස් වල සිදුවුන දේවල් දිහා බලන කොට එවැනි දෙයක් සිදුවන බවයි පෙනුනේ.

ඒත් දැන් ඒ තත්ත්වය යට ගිහින් ආණ්ඩුවට ආධාර ලැබීමත් වැඩි වුනා. ගෝලීය බලවතුන් තුල ආණ්ඩුව ඉවත් කරල කුමක් බලයට පත් කරනව ද කියල පටලැවිල්ලක් ඇතිවෙලා වගෙයි.

කොහොමටත් යූ ඇන්පී යට තනි බලයක් ලෙස නැගී සිටලා දැන් මතුවෙන සමාජ සටනට මුහුණ දෙන්නට පුළුවන්ද කියන ප්‍රශ්ණය මතු වෙනව. උතුරෙ අරගලයත් දැන් සමාජ ස්වරූපයක් ගනිමින් සිටිනවා. එයටත් වඩා වැඩ කරන ජනතාව තුලින් මතුවන වැඩවර්ජන හා අනෙකුත් සටන් වලට යූඇන්පී පාලනයකට මුහුණ දෙන්නට පුළුවන්ද කියන ප්‍රශ්ණයත් මතුවෙනව.

ඒ නිසා රට සන්සුන් කර තබන්නට රනිල් දමන යෝජනා වලට හැකියාවක් නෑ කියල ගෝලීය ධනවාදී බලයට පෙනී යනවට කිසිම සැකයක් නෑ. මේ උඩයි අද පටලැවිල්ලක් තියෙනව නම් තියෙන්නේ. ගෝලීය බලවතුන්ට හැම දෙයක් ම පාලනය කරන්නටත් තමන් සිතන හොද ම දෙය ම කරන්නටත් ඉඩක් නෑ.

එනිසා වඩා සුදුසු ම ක්‍රියාවලිය දියත් කිරීමට යි ඔවුන්ට සිදුවෙන්නේ. පාලකයින් අතරින් ඕනා කෙනෙකුට ශක්තිය දෙන්නටත්, ආධාර දෙන්නටත් ඔවුන්ට හැකියාව තිබුණට විරුද්ධ ව නැගී සිටින සමාජ බලවේග තමන් ට ඕනා අතට හරවන්න බැරි බව ඔවුන් පසුගිය කාලය තුල අත් දැකීමෙන් දන්නව.

මේ නිසාම තමා දේශපාලන, මිලිටරි, රහස් ක්‍රියාමාර්ග තුලින් හැම දෙයක්ම මෙහෙයවන අදහස අත් හැරල වඩා තැනට සුදුසු ක්‍රියාමාර්ගය ගන්න තැනට ගෝලීය බලවතුන් පත්වෙලා ඉන්නේ.

අද ඔවුන් ගන්න පුළුවන් ක්‍රියාමාර්ග විශාලයි. ඇමරිකාව ප්‍රධාන Anglo Saxon බලවේගයට අමතරව, යුරෝපය, ජපානය, ඉංදියාව, චීනය ආදී මධ්‍යස්ථාන රාශියක් තුලින් මෙහෙයවීම් කිරීම ට ගෝලීය ධනපති සංස්ථාව ට අද හැකියාව තිබෙනවා.

**රනිල් ද මහින්ද ද?**

ඒ සියල්ලේ වාසිය කොයි අතට පෙරලේද කියල කියන්න පුළුවන් ඉදිරි කෙටි කාලය තුල රට ගමන් ගන්න ආකාරයට යි. දැන් නැගී එන සමාජ බලවේග වලට මුහුණ දීමට යූඇන්පීය ට ඇති හැකියාව ඉතා ම අඩු බව කාටත් පෙනෙන දෙයක්.

එය පාලනය කල හැකි පෙරමුණක් මතුවෙන්නට ඕනා ආණ්ඩුව තුලින් ම යි. නැත්නම් ධනපති ක්‍රමයට ම පල්ලම් බහින්න වෙනව.

රනිල්ට ඉඩ දීල මුළු ක්‍රමයට ම අභියෝගයක් වන දේශපාලන රැල්ලකට ඉඩ දෙනවද? නැත්නම් මහින්ද මගින්ම සමාජය මෙල්ල කිරීමට අළුත් රාමුවක් හදනවද? මේ තමා ගෝලීය ධනවාදයට මුහුණ දෙන්නට සිදු වෙලා තියෙන ගැටළුව.